<u>වෙබ් නිවේදනය</u>

යොමුව- <u>නාරා/පාලන/2021/116/RL/ටෙන්ඩර් අංක46</u>

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

## ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය,කාක දූපත , මට්ටක්කුලිය ,කොළඹ-15

ජාතික ජලජ සම්පත් පර්යේෂන හා සංවර්ධන නියෝජිතායතනනයේ (නාරා)සිට කළුතර හරහා අළුත්ගම දක්වා කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කිරිම සදහා ප්‍රසම්පාදන මණ්ඩලය විසින් මාසිකව ගෙවීමේ පදනම මත කුළී වාහන ලබා ගැනීම වෙනුවෙන් ලංසු ඉදිරිපත් කරන ලෙසට මෙයින් ආරාධනා කරමි.

අදාළ වන්නාවූ විස්තර සහිත ලංසු ආකෘති හා ලංසු ආරාධනා ලේඛණ සඳහා ආපසු නොගෙවන රු:500.00 ක මුදලක් සෘජුවම මහජන බැංකුව-මෝදර ශාඛාවේ ගිණුම් අංක 214-100-1536-29716 දරණ ගිණුමට බැර කර අදාළ රිසිට්පත ලංසුකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ලංසු ලේඛනය සමග ඇක්විමට හෝ නාරා ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත "අධ්‍යක්ෂක ජනරාල්'',නාරා නමින් තැන්පත් කිරිමෙන් පසුව මිලදී ගැනුම් හා සැපයුම් ඒකකය වෙතින් ලබා ගත හැකිය.

01.අවශ්‍ය කෙරෙන වාහන පංතිය, ගමන් මාර්ගය හා අනෙකුත් පිරිවිතරයන් පහත දක්වා ඇත. කොන්ත්‍රාත් කාල සීමාව සංශෝධනය කිරිමේ පදනම මත 01 ක් වසරක කාල සීමාවක් සඳහා ලංසු කැදවනු ලැබේ.

| ප්‍රවාහන සේවාව | ගමන් මාර්ගය | එක් ගමන් මාර්ගයක දුර කි.මී | | ආරම්භ කළ යුතු වේලාව හා ස්ථානය | ආපසු ගමන් කළ යුතු වේලාව හා ස්ථානය | වාහන පංතිය |
|---|---|---|---|---|---|---|
| | | නාරා සිට කළුතර බස් නැවතුම් පළ දක්වා | කළුතර බස් නැවතුම් පළ සිට අලුත්තම දක්වා | | | |
| නාරා- කළුතර හරහා අලුත්තම | උදැසන- අලුත්ගම බස් නැවතුම ඉදිරිපිට සිට ගාලු පාර ඔස්සේ කොටුව දුම්රියපොළ ඉදිරිපිට මල්වත්ත පාරේ සිට අබ්දුල් කාදර් මාවත (රෙක්ලමේෂන් පාර)අලුත් මාවත පාර,විස්ට්වයික් පාර,සී බීච් පාර,නාරා පාර ඔස්සේ මට්ටක්කුලිය කාක දූපත නාරා ප්‍රධාන කාර්යාලය.<br>සවස- නාරා ප්‍රධාන කාර්යාලයේ සිට නාරා පාර,සී බීච් පාර,විස්ට්වයික් පාර,අලුත්මාවත පාර,කෝ සිරිල් සී පෙරේරා මාවත,බ්ලුමැන්ඩල් පාර,ආමර් විදිය,පංචිකාවත්ත,මරදාන දූමරිය පොළ, ටෙක්නිකල් හන්දිය,පිටකොටුව හරහා ගාලු පාර ඔස්සේ අලුත්ගම බස් නැවතුම දක්වා. | උදැසන ගමන් වාරය- කි.මී 50.0<br>සවස ගමන් වාරය- කි.මී 52.7 | උදැසන ගමන් වාරය- කි.මී 18.1<br>සවස ගමන් වාරය- කි.මී 18.1 | පෙ.ව 06.00 ට අලුත්ගම බස් නැවතුම ඉදිරිපිට සිට (මාර්ග තදබදය මත වේලාව සංශෝධනයට යටත් වේ)<br>කොටුව මල්වත්ත පාරට උදැසන 08.05 වන විට පැමිණිය යුතුවේ. එම ස්ථානයෙන් පෙ.ව8.10 ට නාරා දක්වා ගමන් ආරම්භ කල යුතුය. | ප.ව 04.20 ට කොළඹ-15 මට්ටකුලිය නාරා ප්‍රධාන කාර්යාලයෙන් | ආසන 54 |

02.ලංසුවේ වලංගු කාලය ලංසු භාර ගන්නා අවසාන දිනයේ සිට වැඩකරන දින 90 ක් එනම්, 2021.09.15තෙක් විය යුතුය.

**03.** ලංසු ඉදිරිපත් කිරිමේදී ප්‍රවාහන සේවාව සදහා ලංසු සුරක්ෂණ ප්‍රකාශයක් සමග පිළිගත් වාණිජ බැංකුවකින් ලබා ගත් රු:15,000.00 ක ලංසු සුරක්ෂණයක් හෝ නාරා ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත මුදලින් ගෙවා ලබා ගත් රිසිට්පතේ මුල් පිටපත ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය.

**04.**ලංසු ඉදිරිපත් කිරිමේදී  ආකෘතියේ කපා හෝ මකා හෝ වෙනයම් ආකාරයකින් හෝ වෙනසක් සිදු කරන්නේ නම් එම ස්ථානයන් හි ස්වකීය කෙටි අත්සන හා මුද්‍රාව යොදා එම වෙනස් කිරිම සහතික කළ යුතු අතර,එසේ නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**05.** අදාළ වන්නා වූ විස්තර සහිත ලංසු ආකෘති හා ලංසු ආරාධනා ලේඛණය නිකුත් කරනු ලබන්නේ 2021 මැයි 06සිට 2021 මැයි මස 12 වන දින දක්වා පමණි.

07.මුද්‍රා තබන ලද ඔබගේ ලංසුව 2021 මැයි මස 13 වන  දින ප.ව 01.00 ට පෙර ''සභාපති,ප්‍රසම්පාදන කමිටුව, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනනය,කාක දූපත,මට්ටක්කුලිය,කොළඹ-15 යන ලිපිනයට ,ලියාපදිංචි තැපැලෙන් හෝ ප්‍රධාන ගොඩනැගිල්ලේ පළමු  මහලේ පිහිටා ඇති මුදල් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටි අංක-01 ට බහාලිමෙන් හෝ ඉදිරිපත් කළ හැකිය.

ලංසු බහාලන කවරය මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතු අතර,එම කවරයේ වම්පස ඉහළ කෙළවර "නාරා-කළුතර හරහා අළුත්ගම දක්වා කාර්ය මණ්ඩළ ප්‍රවාහන සේවාව සදහා මිළ ගණන් කැදවීම-2021/ටෙන්ඩර් පෙට්ටි අංක- 01" යනුවෙන් සදහන් කළ යුතුය.

08.2021 මැයි මස 13 දින ප.ව  01.00 ට  ඉදිරිපත් වී ඇති ලංසු එදින එම වේලාවට ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනනයේ (නාරා) මුදල් අංශයේදී විවෘත කරනු ලබන අතර ,එම  අවස්ථාවට ලංසුකරුට හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයකුට සහභාගි විය හැකිය.

09.මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු අවශ්‍ය නම්,ප්‍රසම්පාදන නිළධාරි මගින්  ලබා ගත හැකිය.

ප්‍රසම්පාදන කමිටු තීරණය අවසන් තීරණය වේ.

සභාපති
ප්‍රසම්පාදක මණ්ඩලය
ජාතික  ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය
කාක දූපත ,මට්ටක්කුලිය
කොළඹ15-
0112/529717  -0112-521000

දිනය-2021 මැයි මස 06